පිළිගත් නිර්දේශ

6.1. මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම සලකා බැලීම (උරුගුවේ # 1);

6.2. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (පෝලන්තය # 3), (උරුගුවේ # 2), (ඩෙන්මාර්කය # 3);

6.3. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (සෙනගාලය #1);

6.4 වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය වෙත ප්‍රවිෂ්ඨ වීම (නවසීලන්තය # 4);

6.5. හැකිතාක් ඉක්මනින් වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (ඝානාව # 1);

6.6. අපරානුමත කිරීමෙන් අනතුරුව, වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය ක්‍රියාත්මක කිරීම. (මහා බ්‍රිතාන්‍යයේ හා උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානිය # 1)

6.7. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම සලකා බැලීම (ඇෆ්ගනිස්ථානය # 1);

6.8. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම සලකා බැලීම (අයිවොරි කෝස්ට් #1)

6.9. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ අදාළ විකල්ප ප්‍රොටොකෝලය මෙන්ම, ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා වන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම. (ග්වාටමාලාව 1);

6.10. අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් හා වධහිංසා හෝ අනෙකුත් අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක්කිරීම් වලට එරෙහිව ආරක්ෂා කිරීම තහවුරු කිරීම සහ වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය සඳහා වන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (පෘතුගාලය # 1);

6.11. මානව හිමිකම් කවුන්සිලය සහ එහි යාන්ත්‍රනය සමඟ එහි සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම (මියන්මාරය # 2);

6.12. විශේෂ කාර්ය පටිපාටිකරුවන්ට ලැබෙන ඉල්ලුම්පත මගින් පැමිණෙන ඉල්ලීම් වලට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීම; (ලැට්වියාව # 1)

6.13. මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වඩාත් පුළුල් රාමුවක් නිර්මාණය කිරීම සඳහා ව්‍යවස්ථා සන්ශෝදනය පවත්වා ගෙන යෑම (වියට්නාමය # 1);

6.14. සමස්ත ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියට ගෙන යෑම සහ ජාතික මානව හිමිකම් සැලැස්ම සැලසුම් කර ඇති පරිදි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඉදිරියට ගෙන යාම. (මෙක්සිකෝව # 2)

6.15. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා ප්‍රමාණවත් අරමුදල් සහ මිනිස් බල සහතික කිරීම (පිලිපීනය # 1);

6.16. පැරිස් ප්‍රතිපත්ති අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පූර්ණ අනුකූලතාවය තහවුරු කිරීම; (ඇෆ්ගනිස්ථානය # 2)

6.17. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්රියාත්මක කිරීම තහවුරු කිරීමට උත්සාහ කිරීම (මියන්මාරය # 1)

6.18. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම සම්මත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රයත්නයන් තව දුරටත් පවත්වාගෙන යාම (පකිස්ථානය # 2);

6.19. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන් සමග ක්‍රියා කිරීම. (පිලිපීනය # 2)

6.20. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම 2017-2021, විශේෂයෙන්ම පළාත් මට්ටමේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් ආයෝජනය වීම තහවුරු කිරීම (සිංගප්පූරුව # 1)

6.21. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රයත්න තව දුරටත් පවත්වා ගෙන යාම (සුඩානය # 1);

6.22. සියලුම රාජ්‍ය ආයතන සහ අදාළ පාර්ශවකරුවන්, මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම පිළිබඳව දැනුවත්ව සිටීම හා සියලුම ජන්තාවගෙ, විශේෂයෙන්ම සමාජයේ වඩාත්ම අවදානමට ලක් වූ පුද්ගලයින්ගේ, සුභසිද්ධිය සඳහා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම; (තායිලන්තය # 2)

6.23. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම 2017-2021 ක්‍රියාත්මක කිරීම සඳහා සියළු මට්ටම්වල රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීම මගින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව මානව හිමිකම් ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීම. (වෙනිසියුලාව (බොලිවියානු ජනරජය) # 1)

6.24. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආයතන සහ යාන්ත්‍රණ සමඟ සමීප සහයෝගීතාවය පවත්වා ගෙන යාම (අසර්බයිජානය # 1);

6.25. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්‍රියාත්මක කිරීම (කියුබාව # 2);

6.26 මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දණය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම යටතේ සැලසුම් කර ඇති ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම තහවුරු කිරීම (බෙලරුසියාව #1)

6.27. බිම් මට්ටමේ සිට නව ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කිරීම සඳහා දැනුවත් කිරීම (ඉතියෝපියාව # 2);

6.28. ශ්‍රී ලාංකීය සමාජය තුළ විශ්වාසය ගොඩනැගීම මගින් ජාතික සංහිඳියාව සඳහා පහසුකම් සැලසෙන පරිදි අධ්‍යාපනික විෂය මාලවට "මානව අයිතිවාසිකම්" විෂයය ඇතුලත් කිරීමට මූලිකත්වය ගැනීම (ඉන්දියාව # 1);

6.29. රටේ සියලුම අංශ සඳහා මානව හිමිකම් අධ්‍යාපනය ව්යාප්ත කිරීම (බුරුන්ඩි # 1);

6.30. ශ්‍රී ලංකාව පිළිගත් ජාත්යන්තර බැඳීම්වලට අනුකූලව ඕනෑම වෙනස්කම් කරන නීති සහ පිළිවෙත් අමාන්ත්‍රණය කිරීමේ ප්‍රයත්නයන් පවත්වාගෙන යාම (ඉතියෝපියාව # 1);

6.31. අවදානම් සහිත කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින් සියළු ආකාරයේ වෙනස්කම්වලට එරෙහිව සඳහා සටන් කිරීම (සෙනගාලය # 2);

6.32. සමාජයේ අසරණ වූ සහ අවදානමට ලක් වූ කොටස්වල අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ උත්සාහයන් පවත්වාගෙන යාම (නේපාලය # 2);

6.33. ඕනෑම පුරවැසියෙකු හෝ ප්‍රජාවක, ඔවුන්ගේ මූලාරම්භය, වයස සහ අනන්යතාවය කුමක් වුවද සමානාත්මතාවයට හා වෙනස්ව නොසැලකීමට ඔවුන්ට ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම (බොලිවියාව # 1);

6.34. කාන්තාවන් සහ ගැහැණු දරුවන් ඇතුළුව සුළුතර ජනකොටස් වලට එරෙහිව ඇති සියලුම ආකාරයේ වෙනස්කම් හා ප්‍රචන්ඩත්වයන් මුලිනුපුටා දැමීමට ක්‍රියාමාර්ග ගැනීම සහ කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ ම වෙනස්කොට සලකනු ලැබීම ඉවත් කිරීම පිළිබඳ කමිටුව මේ සඳහා මෑතක දී දුන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම. (නවසීලන්තය # 2)

6.35. වාර්ගිකත්වය, ස්ත්‍රී -පුරුෂ භාවය, කුලය හෝ වෙනත් කරුණු මත පදනම්ව සමාජයේ සුළුතර ජන කොටස්වලට එරෙහිව සිදුවන සියළු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ අරමුණින් නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම (උරුගුවේ # 4);

6.36. විශේෂයෙන් වාර්ගිකත්වය හා ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කම් වලට එරෙහිව සටන් කිරීම සහ ඒවා වැළැක්වීම (ඉතාලිය # 4);

6.37. LGBTI පුද්ගලයින්ට එරෙහිව සිදුවන වෙනස්කම් හා ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය හා ඒවාට විරුද්ධව දඬුවම් පැමිණවීම මගින් LGBTI පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීම තහවුරු කිරීම (ආර්ජන්ටිනාව # 2)

6.38. LGBTI පුද්ගලයින් ඇතුළු ප්‍රධාන ජනගහනයේ විශේෂ අවශ්‍යතා සඳහා අවධානයක් යොමු කරමින්, HIV / AIDS සන්දර්භය ඇතුළුව, සෞඛ්‍යය ආරක්ෂණ සැකසුම්වල සියළු ආකාරයේ වෙනස්කම් ඉවත් කිරීම සඳහා පියවර ගැනීම. (පෘතුගාලය  # 2)

6.39. වෛරී භාෂාව සහ වෛරය පැතිරිවීමට පෙළඹවීම පිළිබඳ පුළුල් නීතිකාරකයක් ක්‍රියාත්මක කිරීම (සියෙරා ලියෝනය # 2);

6.40. වෛරී භාෂාවට එරෙහිව සටන් කිරීමේ ප්‍රයත්න පවත්වා ගෙන යාම (ටියුනීසියාව # 3);

6.41. වාර්ගික හා ආගමික සුළුතරයට විරුද්ධව, වෛරී භාෂාව හා ප්‍රචණ්ඩ ක්‍රියා පොළඹවන පුද්ගලයන්ට දඬුවම් කිරීම සහ ඒවා වැළැක්වීමේ අරමුණින් ශක්තිමත් ක්‍රියාමාර්ග ගැනීම. (නැමිබියාව # 3)

6.42. සුළුතර ආගමික සාමාජිකයින්ට එරෙහිව සිදුවන සියළු ප්‍රහාර සහ වෛරී භාෂා විමර්ශනය, අපරාධකරුවන්ට දඬුවම් කිරීම සහ ඒවා නැවත ඇතිවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම. (ඕස්ට්‍රේලියාව # 3);

6.43. කෘෂිකර්මයේදී රසායනික ද්‍රව්‍ය දැඩි ලෙස භාවිතා කිරීම පිළිබඳ අවධානය ඉක්මනින් යොමු කිරීම (ඉරාකය # 1);

6.44. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය හා එහි ජනගහනයේ මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශගුණික විපර්යාස අභියෝගයන් ජයගැනීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතියක් ලබා ගැනීම. (නිකරගුවාව # 2);

6.45. ආපදා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පාරිසරික ප්‍රතිපත්ති සහ උපායමාර්ගවල මානව හිමිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය ඒකාබද්ධ කිරීම (කියුබාව # 1);

6.46. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාත්මක කිරීම තුලට දේශගුණික විපර්යාස පිළිබඳ සලකා බැලීම් අන්තර්ගත කිරීම. (වියට්නාමය # 2);

6.47. බිම් මට්ටමේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රයත්නයන් පවත්වාගෙන යෑම (පාකිස්ථානය # 1);

6.48. එක්සත් ජාතීන්ගේ 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය තුළ වැඩසටහන් යටතේ වැඩසටහන් සපුරා ගැනීම සඳහා වන මූලික පියවර ලෙස ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු කිරීම. (එක්සත් අරාබි එමිර් රාජ්‍ය # 1)

6.49. සමස්ත ජනගහනය සඳහා තිරසාර සංවර්ධන ඉලක්කයන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා දරන උත්සාහයන් පවත්වාගෙන යෑම (ඇල්ජීරියාව # 2);

6.50. ත්‍රස්ත්වාදයට එරෙහිව සටන් කිරීමේ ප්‍රතිපත්තිවල මානව හිමිකම් ප්‍රවේශය ශක්තිමත් කිරීම (පෙරු # 2);

6.51. ජාත්‍යන්තර ප්‍රමිතීන් ට අනුකූල වන පරිදි ත්‍රස්ත විරෝධී ව්‍යවස්තාව සමාලෝචනය කිරීම (එස්ටෝනියාව # 2);

6.52. මරණ දණ්ඩනය අහෝසි කිරීම සලකා බැලීම (ඉතාලිය # 1);

6.53. මරණ දණ්ඩනය අහෝසි කිරීම (ටිමෝර්-ලෙස්ටේ # 2);

6.54. වධහිංසා පැමිණවීමට කිසිසේත්ම ඉඩ නොතබන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හා වධහිංසා වැළැක්වීමේ ධාරිතාව ඉහල නැංවීම නියාමනය හා ආයතනික රාමුව ශක්තිමත් කිරීම (ඉන්දුනීසියාව # 3);

6.55. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව, පොලිසිය හා හමුදාව මගින් අත්අඩංගුවේ තබාගෙන සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් වධ හිංසනය වැළැක්වීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම; (ඉරාන (ඉස්ලාමීය ජනරජය) # 2)

6.56. පොලිසිය මගින් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සහ වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා පොලිස් බලකායන් සහ බලධාරීන්ට වැඩසටහන් හඳුන්වා දීමට අවශ්‍ය සියළු පියවර ගැනීම (ස්ලොවේකියාව # 3);

6.57. පාපෝච්චාරණය ලබා ගැනීම සඳහා පොලිස් පරීක්ෂණ මගින් සිදුකරන ලද සියළු ආකාරයේ වධහිංසා සහ ප්‍රචණ්ඩත්වයට දඬුවම් කිරීම සඳහා දැඩි නීතිමය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම (මැඩගස්කරය # 1);

6.58. රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ රටේ නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම (නේපාලය # 1);

6.59. ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුකූලව නීති සම්පාදනය කිරීම සහ අධිකරණ හා බන්ධනාගාර පද්ධති වැඩිදියුණු කිරීම මෙන්ම ජාතික හා ආගමික සුළු ජන කොටස්වල අයිතිවාසිකම් පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම (රුසියානු සමූහාණ්ඩුව # 1);

6.60. අපරාධ නීතියට පටහැනිව අපරාධයක් ලෙස බලහත්කාරයෙන් අතුරුදහන් වීම ඇතුලු සියළු ජාතිකයන් විසින් බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් සියළු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතිය සම්පූර්ණ හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා පෙරට ගෙන යාම (ස්පාඤ්ඤය # 1)

6.61. බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් සිදු කිරීම පිළිබඳ නීති සම්පාදනය කිරීම සඳහා වූ සියලූම තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතියට අනුව ජාතික නීතියක් නිර්මාණය කිරීම; (ස්වීඩනය # 1)

6.62. සුදුසුකම් සහිත ස්වාධීන කොමසාරිස්වරුන් පත් කිරීම සහ ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම මගින් අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක කිරීම. (ජර්මනිය # 1)

6.63. අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට ප්‍රමාණවත් සම්පත් ලබාදීම සහ ස්වාධීනව හා කාර්යක්ෂමව සිය මෙහෙවර ඉටු කිරීමට ඉහල සුදුසුකම් සහිත සාමාජිකයන් ඇතුලත් කිරීම (කොරියානු ජනරජය # 1);

6.64. අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසම ඇතුළුව, අතුරුදන්වූවන් පිළිබඳ පූර්ව කොමිසම්වල සියළු වාර්තා නිකුත් කිරීම (ස්විස්ටර්ලන්තය # 1);

6.65. ජාතික නීතියේ සාපරාධී අපරාධයක් ලෙස බලහත්කාරයෙන් අතුරුදන්කිරීමේ සිද්ධීන් නිර්වචනය කිරීමට නීත්‍යානුකූල විධිවිධාන අනුගමනය කිරීම සහ වගකිවයුත්තන් නීතිය ඉදිරියට ගෙන ඒම (ස්ලෝවැකියාව #1)

6.66. අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, වධහිංසා සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ලෙස එල්ල වී ඇති සියලුම චෝදනා, ස්වාධීන ආයතනයක් මගින් අපක්ෂපාතීව සහ කාර්යක්ෂමව විමර්ශනය කිරීම (ඉතාලිය #2)

6.67. රඳවා ගත් අයගේ නම් සහ ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පවුල් විසින් කර ඇති ඉල්ලීම ඉටු කිරීම (ප්‍රංශය # 1);

6.68. ආරක්ෂක අංශ සඳහා යුද අපරාධ සහ මානව හිමිකම් පිළිබඳ විමර්ශනය කිරීමට පුහුණුව ලබාදීම සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීම. (ඉරානය (ඉස්ලාමීය ජනරජය) # 1);

6.69. සිවිල් යුද්ධයේදී සිවිල් වැසියන්ට සිදු වූ අපයෝජනයන් පිළිබඳ විමර්ශන කටයුතු අවසන් කිරීම (ප්‍රංශය # 2);

6.70. සන්නද්ධ ගැටුමේදී සිදුවූ උල්ලංඝණයවීම් විමර්ශනය කිරීම හා නීතිමය පිළියම් ලබා දීමට පුළුල් ක්‍රියාමාර්ග ගැනීම (සියෙරා ලියෝන් # 3)

6.71. ගැටුම් සහ එහි පසු විපරම් සිදු වූ සියළු මානව හිමිකම් උල්ලංඝණයන් ස්වාධීන හා අපක්ෂපාතීව විමර්ශනය කිරීම සහ අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම සහ විපතට පත් වින්දිතයින්ට නිසි ලෙස සහන සැලසීම (පලස්තීන රාජ්‍ය # 1);

6.72. මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ අපයෝජනයන් සඳහා ආරක්ෂක හමුදා හා රජයේ නිලධාරීන් වගවීම (ඇමෙරිකා එක්සත් ජනපදය # 2);

6.73. යුද ගැටුම් සමයේ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධි විමර්ශනය තීව්‍ර කිරීම, අපරාධකරුවන්ට දඬුවම් කිරීම සහ වින්දිතයන්ට ප්‍රමාණවත් වන්දි ලබා දීම (ආර්ජන්ටිනාව # 1);

6.74. යුද්ධයේ වින්දිතයන්ගෙ අවශ්‍යතාවයන්ට අනුව මනස්-සමක සහය වැඩපිළිවෙළවල් ඇති කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කඩිනම් කිරීම (ඉරානය (ඉස්ලාමීය ජනරජය) # 3);

6.75. අතුරුදහන්වූවන්ගේ මෑතකදී ස්ථාපිත කරන ලද කාර්යාලයේ ස්වාධීන හා අපක්ෂපාතී කාර්යයන්වල පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර පරිචයකයන්ගෙ සහයෝගය ඇතිව, විශ්වසනීය, වින්දිතයන් කේන්ද්‍ර කරගත් හා වගකීමෙන් යුතු යාන්ත්‍රණයක් සැකසීම මගින්, සන්ක්‍රාන්තික යුක්තිය සම්බන්ධයෙන් සිදුකරන ලද සියළු කැප කිරීම් ඉටු කිරීම (ස්ලොවේනියාව #1);

6.76. සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය නිර්මාණය වී ඇති බව තහවුරු කිරීම (ප්‍රංශය # 3);

6.77. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය ආරම්භ කිරීම, නව ත්‍රස්ත විරෝධී නීති සම්පාදනය කිරීම මෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල ජනතාවගේ ඉඩම් අතිරේකව මුදා හැරීම ඇතුළු සංහිඳියාව සහ සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය වේගවත් කිරීම. (තායිලන්තය # 1);

6.78. සත්‍ය, යුක්තිය සහ සංහිඳියාව ඇතුළුව ජාතික යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම හා වන්දි ගෙවීම සඳහා කාර්යාලයක් පිහිටුවීම ඇතුළුව සන්ක්‍රාන්තික යුක්ති ධර්මයක් සහතික කිරීම සඳහා අධිකරණ හා අධිකරණ නොවන රාමුවක් ඇතුළත් ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීම (බෙල්ජියම # 1);

6.79. කන්තාවන්ගේ සමාන සහභාගීත්වය, ලිංගික හිංසනය සහ කාන්තා හිංසනය සම්බන්ධව කටයුතු කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් තීන්දු දියහැකි, පුහුණුව ලැබූ පුද්ගලයන් ඇතුලත් වූ සන්ක්‍රාන්තික යුක්ති පද්ධතිය ස්ථාපිත කිරීමට යොදා ගෙන ඇති ක්‍රියාවලිය වේගවත් කිරීම. (මෙක්සිකෝව # 1);

6.80. සියලු පාර්ශ්වකරුවන් සමඟ සහභාගී වන අතරතුර, ජාතික සංහිඳියාව සඳහා සිය ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යාම (ජපානය # 1);

6.81. සංහිඳියාව සහ ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා දරන ප්‍රයත්නයන්, අභ්‍යන්තර අවතැන්වූවන් නැවත පැමිණීම හා යළි පදිංචි කිරීම, සහ හිටපු සටන්කාමීන් පුනරුත්ථාපනය කිරීම වැනි උත්සාහයන් නොනවත්වා ඉදිරියට ගෙන යෑම (නිකරගුවාව # 1)

6.82. ජාතික සමගි සන්ධානයක් කරා ගෙන යාමට දරන ප්‍රයත්නයන් දිගටම ගෙන යාම (පෙරූ # 1);

6.83. ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීම සඳහා සහ අන්තර් කාලීන සන්ක්‍රාන්තික යුක්තිය ඉටු කිරීම සහතික කිරීම (කටාර් අංක 1);

6.84. සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වැනි ජාතික ක්‍රියාමාර්ග තුළින්, සංහිඳියාව, මානව හිමිකම් පිළිබඳ වගවීම සඳහා දරන ප්‍රයත්නයන් තවදුරටත් ඉදිරියට ගෙන යෑම. (බ්‍රසීලය # 1)

6.85. මානව අයිතිවාසිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 අනුව සත්‍ය සඳහා කොමිසමක්, අධිකරණ යාන්ත්‍රණයක් සහ වන්දි ගෙවීමේ කාර්යාලයක් නිර්මාණය ඉක්මන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. (අයර්ලන්තය # 2)

6.86. 30/1 හි නිශ්චිතව දක්වා ඇති පරිදි, සත්‍ය සඳහා කොමිසමක්, අධිකරණ යාන්ත්‍රණයක් සහ වන්දි ගෙවීමේ කර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම. (ජර්මනිය # 2)

6.87. මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරන ලද යෝජනාව 30/1 ට අනුව එහි සංහිඳියාව සහ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ කාලීන හා අඛණ්ඩ ප්‍රගතිය පවත්වා ගෙන යාම. (නවසිලන්තය # 1)

6.88. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 හි ඇති එකඟත්වයන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම (ඇමෙරිකා එක්සත් ජනපදය # 1);

6.89. ජාතික සංහිඳියාව හා සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශ සහ ජාතික සහජීවන, සංවාදය සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මගින් ජාතික සංහිඳියා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තවදුරටත් ඉදිරියට ගෙන යාම. (ජාතික වෙනිසියුලාව (බොලිවියානු ජනරජය) # 2)

6.90. සන්නද්ධ ගැටුමේ පසු විපරමට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීමට දරන උත්සාහයන් දිගටම පවත්වා ගැනීම. (ඇල්ජීරියාව # 1)

6.91. ආගමික හා ජනවාර්ගික සුළු ජාතීන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය හා බියගැන්වීම් වැළැක්වීම මගින් ජාතික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සහ අපරාධකරුවන්ට එලදායී නඩු පැවරීම හා දඬුවම් කිරීම (වතිකානුව අංක 3);

6.92. අපරාධ හා සාක්ෂිකරුවන්ගේ වින්දිතයන් සඳහා වූ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා වන්දි ලබාදීම සිදු කිරීම (ඊජිප්තුව # 1);

6.93. සාක්ෂිකරුවන්ගේ සහ වින්දිතයින්ගේ ආරක්ෂාව සඳහා බලය සහ බෙදීම්වල ස්වාධීනත්වය සහ අඛණ්ඩතාව සහතික කිරීම සහ 2018 අයවැය සමග ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම (ජර්මනිය # 3);

6.94. ආගමික නිදහස ආරක්ෂා කිරීම සහ අන්තර් ආගමික සංවාද ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නය ශක්තිමත් කිරීම (ඉතාලිය # 3);

6.95. ආගම සහ විශ්වාසයේ අයිතිය පිළිබඳ ඇති අයිතිය හා ගරුත්වය සහතික කිරීම (මැඩගස්කරය # 2);

6.96. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය යටතේ එහි වගකීම්වලට අනුකූලව ආගම සහ විශ්වාසයේ නිදහස තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා උත්සාහයන් වැඩිදියුණු කිරීම (බෙල්ජියම # 2);

6.97. විවිධ ආගමික කණ්ඩායම් අතර සහයෝගිතාව වර්ධනය කිරීම, වියහැකි ප්‍රචණ්ඩත්වය හා ආගමික වෛරය පැතිරීම වැළැක්වීම සඳහා අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය කිරීම (නෙදර්ලන්තය # 3);

6.98 ආගමික වශයෙන් පෙළඹවූ ප්‍රචණ්ඩත්වයේ සියලු සිදුවීම්වලට නඩු පැවරීම සහ දඬුවම් කිරීම මගින් සියලු පුරවැසියන් සහ පදිංචිකරුවන් සඳහා ආගම හෝ විශ්වාසය පිළිබඳ නිදහස සහතික කිරීමට පවත්නා නීතිය හා පුරුද්ද ප්‍රවර්ධනය කිරීම. (පෝලන්තය # 1);

6.99. ආගමික සුළුතර ප්‍රජාවන්ට එරෙහි හිරිහැර කිරීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුද්ගලයන් වගවීමට ක්‍රියාමාර්ග ගැනීම (එක්සත් ජනපදයේ ඇමරිකාව #3)

6.100. ආගමික සුළුතරයේ සාමාජිකයන් බිය ගැන්වීම හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සියලු ක්‍රියාවන් හෙළාදැකීම හා සියලු වරදකරුවන්ට යුක්තිය ඉදිරියට ගෙනයාම (නෙදර්ලන්තය # 2);

6.101. සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලුම පියවර ගැනීම සහ ඔවුන්ට එරෙහිව සිදුවන තර්ජන හා පහරදීම් පිළිබඳව විමර්ශනය කිරීම (පලස්තීන රාජ්‍ය # 2);

6.102. සිවිල් සමාජය සහ මානව හිමිකම් ආරක්ෂා කරන්නන් සඳහා ආරක්ෂිත සහ පහසු පරිසරයක් ඇති කිරීම (නෝර්වේ # 5);

6.103. පොලීසියේ මානව හිමිකම් පුහුණුකිරීම් ආදිය තුළින් හිරිහැර හෝ ප්‍රචණ්ඩත්වයට බිය නොවී සමාජයට පූර්ණ ලෙස සහභාගී වීම සඳහා ජාත්‍යන්තර මානව අයිතිවාසිකම්වලට අනුකූලව කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් ආරක්ෂා කිරීම තහවුරු කිරීම. (ෆින්ලන්තය # 2)

6.104. පහරදීම් පිළිබඳ නිසි විමර්ශනයක් සහ වගකිව යුතු අය වගඋත්තරකරුවන් ලෙස පත් කිරීම සඳහා ප්‍රමාණවත් පරීක්ෂණයක් පැවැත්වීමට මානව හිමිකම් ආරක්ෂකයන් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීම. (අයර්ලන්තය # 1);

6.105. මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමට සහ ඒ කාරණය සම්බන්ධයෙන් උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සියලු අවශ්‍යතා සැපයීම (කටාර් අංක 2);

6.106. මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට දරන උත්සාහය ඉදිරියට ගෙන යාම (සුඩානය # 2);

6.107. මිනිස් ජාවාරමට එරෙහි ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැලැස්මෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකාව තුළ සැපයුම් දාමයන්හි විනිවිදභාවය සහතික කිරීමට දරන ප්‍රයත්නයන් ප්‍රසිද්ධියේ වාර්තා කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කිරීම. (මහා බ්‍රිතාන්‍ය සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානිය # 3)

6.108. වන්දි ලබා දීම හා පුනුරුත්ථාපනය මගින් පුද්ගල ජාවරම්වල වින්දිතයන්ට සාර්ථක පිළියම් සැපයීමට පියවර ගනීම (ආර්මේනියාව # 2)

6.109. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා වූ පියවර ශක්තිමත් කිරීම (දකුණු අප්‍රිකාව # 3);

6.110. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කාරක සභාව වැනි අදාළ ගිවිසුම් ආයතන විසින් වාණිජ හා වෙනත් සිවිල් ක්රියාකාරකම් සඳහා හමුදා මැදිහත් වීම අවසන් කිරීම (ඔස්ට්‍රියාව # 4);

6.111. සියළුම මානව අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා ශක්තිමත් පදනමක් සැපයීම සඳහා ආර්ථික හා සමාජීය තිරසාර සංවර්ධනය සහ දරිද්‍රතා අවම කිරීම දිගටම පවත්වාගෙන යාම (චීනය # 1);

6.112. වඩාත්ම අවාසි සහගත සහ ආන්තික කණ්ඩායම් වලින් ඇතුලු සියළු පුද්ගලයින් ආවරණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම; (මාලදිවයින # 2)

6.113. තිරසාර සංවර්ධනය අරමුණු රාමුව තුළ අන්ත දුගීභාවය සමඟ සටන් වැදීමේ ප්‍රයත්නය ඉදිරියට ගෙන යාම. (මොරොක්කෝව # 1)

6.114. දරිද්‍රතාවය අවම කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම (සෞදි අරාබිය # 1);

6.115. සිය දැක්ම 2025 ක්‍රියාත්මක කිරීම,  දරිද්‍රතා අවම කිරීමේ ප්‍රයත්නයන් හා කලාපීය විෂමතාවයන් වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය වැනි පවත්නා වැඩසටහන් පුළුල් කිරීම හෝ අත්‍යවශ්‍ය නව වැඩපිළිවෙළක් දියත් කිරීම. (සිංගප්පූරුව # 2);

6.116. වාර්තාවේ 87 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි 2030 වන විට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති අනුගමනය කරන්න (එක්සත් අරාබි එමීර් රාජ්‍ය # 2);

6.117. ජනතාවගේ ජීවිතයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින්, විශේෂයෙන්ම වඩාත්ම පීඩාවට පත් වූ අංශ සඳහා දරිද්‍රතාවය එරෙහි සටනේ දී සාර්ථක සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අඛණ්ඩව කරගෙන යාම (වෙනිසියුලාව (බොලිවියානු ජනරජය) # 3);

6.118. සෞඛ්‍ය, අධ්‍යාපන හා නිවාස වැඩසටහන් හරහා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන සිය ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අවධානම් සහිත කණ්ඩායම්වල මානව හිමිකම් සහතික කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම (භූතානය # 1);

6.119. 2030 වන විට ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම සඳහා එහි ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් දරිද්‍රතාවය පිටු දැකීම දිරිමත් කිරීම. (බෲනයි දරුසලාම් # 2);

6.120. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් සඳහා ආදායම් සඳහා අවස්ථා ලබා දීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම. (හොන්ඩුරාස් # 4);

6.121. කාන්තාවන්ගේ ගෘහ ඒකක ප්‍රධානීන් සහ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ මානසික සහ සමාජීය සහ ජීවනෝපාය සහාය සහ ප්‍රමාණවත් හා කල්පවත්නා ප්‍රවේශය සඳහා නිවාස පහසුකම් සලසා දීම, කාන්තාවන්ගේ ප්‍රධානීන් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්ගේ ප්‍රධානීන් සුභසාධනය සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඒකාකාරව භාවිතා කිරීම සඳහා ගෘහ ඒකක ප්‍රධානීන් පිළිබඳ විස්තරාත්මක දත්ත පද්ධතියක් ඇති කිරීම. (ෆින්ලන්තය # 1);

6.122. අධ්‍යාපනය, සෞඛ්‍යය රැකවරණ, රැකියා, නිවාස හා ආහාර වැනි දේවල අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ධනාත්මක පියවර ගැනීම දිගටම සිදුකිරීම (චීනය # 2);

6.123. විශේෂයෙන්ම සෞඛ්‍ය හා වෛද්‍ය සේවා ක්ෂේත්‍රය තුළ යටිතල පහසුකම් සංවර්ධනය හා ධාරිතා ඉහල නැංවීම ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කිරීම (ජපානය # 3);

6.124. වතුකරයේ සෞඛ්‍යය හා අධ්‍යාපන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන්කිරීමට පියවර ගැනීම (ඉරානය (ඉස්ලාමීය ජනරජය) # 4);

6.125. බීජිං සම්මේලනයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව 2030 ට සමගාමීව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යයට විශ්වීය ප්‍රවේශය සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු ව්‍යාවස්ථාමය හා දේශපාලන පියවර අනුගමනය කිරීම. (හොන්ඩුරාස් # 2);

6.126. කාන්තාවන්, ළමයින් හා ආබාධ සහිත පුද්ගලයන් ඇතුළු විපතට පත් පුද්ගලයින්ගේ අධ්‍යාපනයට සම ප්‍රවේශයක් ලබා දීම (ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදි ජනරජය # 2);

6.127. ආරක්ෂක අංශවල ප්‍රජාතාන්ත්‍රික පාලනය ශක්තිමත් කිරීම, විශේෂයෙන්ම පුරවැසියන්ගේ දේපලවල හිමිකම සහතික කිරීම සහ ඔවුන්ගේ ජීවනෝපාය සහතික කිරීම සඳහා ආර්ථික ක්‍රියාකාරිත්වයේ මැදිහත්වීම නතර කිරීම, (ස්විට්සර්ලන්තය # 3);

6.128. යුධ හමුදාව විසින් අත්පත් කරගත් ඉඩම් ආපසු ගෙවීම සහ සතුටුදායක වන්දි පද්ධතියක් පිහිටුවීම (ප්‍රංශය # 4);

6.129. අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා වූ හදිසි අවශ්‍යතාවයන් විසඳීම සඳහා ඉඩම් නීති සමාලෝචනය කිරීම (ජෝර්ජියාව# 2);

6.130. ඉඩම් අල්ලා ගැනීම පිළිබඳ චෝදනාවන් විසඳීම සැලකිල්ලට ගනිමින්, නිසි හිමිකරුවන් වෙත නැවත පදිංචි කරවන ලද පුද්ගලික ඉඩම් ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස ඉහළ දැමීමට අවශ්‍ය සියලු පියවර ගැනීම (හයිටි # 3);

6.131. කාන්තා අයිතිවාසිකම් සුරැකීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්ව්‍යාජ ප්‍රතිපත්තියක් සකස් කිරීම (ප්‍රංශය # 5);

6.132. තරුණයින්ගේ වෘත්තීය පුහුණුව සහ යුක්තිය සඳහා ප්‍රවේශය සහ නීති ප්‍රතිසංස්කරණයය සම්බන්ධ කාන්තා අයිතිවාසිකම් කඩිනම් කිරීම සඳහාත් ලිංගික ජ්රතිචාරය ක්රියාත්මක කිරීම සඳහා සියලුම මට්ටම්වල පාලන හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම (ඉන්දුනීසියාව # 2);

6.133. ස්ත්‍රීන් සවිබල ගැන්වීම සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කම් හා හිංසනය ලිහිල් කිරීම වැඩිදියුණු කිරීම සඳහා දරන උත්සාහයන් දිගටම පවත්වාගෙන යාම (ටියුනීසියාව # 1);

6.134. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ක්‍රියාවලිය තුළට කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ම වෙනස්කොට සලකනු ලැබීම ඉවත් කිරීම පිළිබඳ ප්‍රඥප්තිය සම්පූර්ණයෙන්ම ඇතුලත් කිරීම (නෝර්වේ # 2);

6.135. ජාතික නීතියේ සවිස්තරාත්මක සමාලෝචනයක් මගින් ස්ත්‍රී පුරුෂ හා ස්ත්‍රීන් අතර සමානාත්මතාව සහතික කිරීම (ග්වාතමාලාව # 5);

6.136. තම දේශීය නීතියට අනුව ස්ත්‍රීන්ට එරෙහි ලිඛිත හා ප්‍රතිරෝධී කොන්දේසි අවලංගු කිරීම (ලැට්වියාව # 2);

6.137. ඉඩම් බලපත්‍ර සහ දීමනා සම්බන්ධයෙන් අනුප්‍රාප්තික අයිතිය පිළිබඳ නීතිය සහ මුස්ලිම් නීතිය යටතේ විවාහය සඳහා අවම වයස නොලැබීම අතුළුව, කාන්තාවන් සහ ස්ත්‍රීන් අතර සමානාත්මතාව සහතික කිරීම සඳහා දේශීය නීති සමාලෝචනය කිරීම සලකා බැලීම. (ඝානාව #2);

6.138. අනුප්‍රාප්තික අයිතිය, උරුමය සහ ඉඩම් අයිතිය සම්බන්ධව කාන්තාවන්ට එරෙහිව වෙනස්කම් කිරීමේ ක්‍රියාදාමයන් අත්හිටුවීම (ස්පාඤ්ඤය # 2);

6.139. විශේෂයෙන් අයිතිවාසිකම් පාලනය කිරීමේ අයිතිය, නිශ්චල දේපල බැහැර කිරීම හා විවාහයට අවම වයස්වරයක් ඇති කිරීම යන ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සමානාත්මතාවයට බලපෑම් ඇති දේශීය නීති සමාලෝචනය කිරීම (පෘතුගාලය # 5);

6.140. ඉඩම් බලපත්‍ර සහ අනුප්‍රාප්තික අයිතිය පිළිබඳ අයිතිය, සහ නිශ්චල දේපල බැහැර කිරීම මෙන්ම ස්ත්‍රී දේශපාලනික, ආර්ථික හා පොදු ජීවිතයේ කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් සඳහා බාධා ආමන්ත්‍රණය කිරීම අතුළුව කාන්තාවන්ට වෙනස්කම් සිදුවන අභ්‍යන්තර නීති අවලංගු කිරීම (නැම්බියාව # 1);

6.141. කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම සහ ලිංගික හිංසනය මැඩලීම සඳහා වන උත්සාහයන් ඉදිරියට ගෙන යාම (ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය # 1)

6.142. කාන්තාවන්ට එරෙහි හිංසනය ඉවත් කිරීම සඳහා ප්‍රයත්න ශක්තිමත් කිරීම (ජෝර්ජියා අංක 1);

6.143. ලිංගික හිංසනය සටන් කිරීමට දරන සියලු ප්‍රයත්නයන් අනුගමනය කිරීම (සවුදි අරාබිය # 2);

6.144. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම, ස්ත්‍රී පුරුෂ සමජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනය පිටුදැකීමෙ ජාතික ක්‍රියාකාරි සලස්ම, සහ ගැටුම්වල ලිංගික හිංසනය වැළැක්වීම පිළිබඳ ප්‍රකාශනය අනුව, වින්දිතයින්ට සහ දිවි ගලවා ගත් අය සඳහා ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට ක්‍රමෝපායන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම (මහා බ්‍රිතාන්‍ය හා උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානිය # 2)

6.145. කාන්තාවන්ට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩත්වය මර්දනය කිරීමට පුළුල් ක්‍රමවේද්යක් ඇතිකිරීම හා මයිතුනික ප්‍රචණ්ඩත්වය අපරාධකරණය කිරීම (හොන්ඩුරාස් #1);

6.146. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හ ලිංගිකත්වය මත පදනම් වූ හිංසනය පිටුදැකීමේ ජාතික ක්‍රියාකාරි සැලස්ම අඛණ්ඩව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම. (මැලේසියාව # 1);

6.147. ලිංගික හිංසනය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ අවස්ථාවන් හසුරුවන බලධාරීන්ට පුහුණුවීම් පැවැත්වීම (මැලේසියාව # 2);

6.148. ආරක්ෂක හමුදාවන්ට එල්ල වී ඇති ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා එහි ප්‍රයත්නයන් තීව්‍ර කර, අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම සහ දඬුවම් කිරීම (ටිමෝර්-ලෙස්ටෙ # 3);

6.149. කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම, ගැටුම්වලදී ලිංගික හිංසනය අවසන් කිරීම සහ එවැනි අපරාධ සඳහා දඬුවම් නොලැබීමට ඉඩ නොදීම (ඊජිප්තුව # 2);

6.150. කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට සාධාරණය සඳහා යුක්තිය ඉටු කරලීම සඳහා කාන්තාවන්ගේ මේසයක්, පෞද්ගලික කාමර සහ කාන්තා පොලිස් නිලධාරීන් ප්‍රමාණවත් පරිදි සියලු පොලිස් ස්ථාන සජ්ත කිරීම (හයිටි # 2);

6.151. පොදු හා දේශපාලන ජීවිතයේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම හා කාන්තාවන්ට වෙනස්කම් කරන නීති ප්‍රතිශෝධනය කිරීම (ඉරාකය # 2);

6.152. තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ට සහභාගී වීම හා බල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සහ පවුලේ හා සමාජය තුළ ඔවුන්ට එරෙහි වෙනස්කම් කිරීමට එරෙහිව සටන් කිරීම (ලිබියාව # 1);

6.153. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ දේශපාලනික සහභාගීත්වය වැඩිදියුණු කිරීම සඳහා දැනටමත් අනුමත කර ඇති පියවර ශක්තිමත් කිරීම (මොරොක්කෝව # 2);

6.154. සෑම මට්ටමක තීරණ ගැනීමේදී, ස්ත්‍රීන්, පූර්ණ සහ සමාන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, තිරසාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (නෝර්වේ # 1);

6.155. තීරණ ගැනීමේ ක්‍රියාවලියන්හි සෑම අංශයකම කාන්තාවන්ට ඵලදායී ලෙස සහභාගි වීම සහතික කිරීම පිණිස කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය කිරීම පිළිබඳ කටයුතු කිරීම (ස්පාඤ්ඤය # 3);

6.156. දේශපාලන හා මහජන ජීවිතය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා රැකියා සහ සේවා ලබාගැනීමේදී කාන්තා ප්‍රධානීන්ගේ සහාය තවදුරටත් වැඩිදියුණු කිරීම (බහරේන් # 1);

6.157. අයිතීන් සවිබල ගැන්වීම සහ සාධාරණ වන්දි ගෙවීමක් සඳහා වන යාන්ත්‍රණයක් තුළින් ළමයින්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් මුලිනුපුටා දැමීම සඳහා ශක්තිමත් පියවරයන් අනුගමනය කිරීම (ඉක්වදෝරය # 1);

6.158. ළමයින් වැනි අසරණ තත්ත්වයේ සිටින පුද්ගලයන් අධිකරණ පද්ධතියට සහ වෙනත් පැමිණිලි පටිපාටිවලට අර්ථවත් ප්‍රවේශයක් ඇති බව සහතික කිරීමට විශේෂ පියවර ගැනීම (බහරේන් # 2);

6.159. වාර්ගික සම්භවය හෝ ආර්ථික තත්වය පදනම් කරගෙන දරුවන්ට එරෙහිව සිදුවන වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කිරීම (ඉරාකය # 3);

6.160. කාන්තාවන්, ළමයින් සහ ජනවාර්ගික සුළුතර අයිතීන් සුරක්ෂිත කිරීම, ඔවුන් මුහුණ දෙන වෙනස්කම්වලට එරෙහිව සටන් කිරීම සඳහා උත්සාහ දැරීම (පෝලන්තය # 2);

6.161. නිවස ඇතුලුව සියලු සැකසුම්වල දරුවන්ට ශාරීරිකව දඬුවම් කිරීම තහනම් කිරීම (මොන්ටිනිග්රෝ රාජ්‍යය # 2);

6.162. ළමුන්ගේ ආරක්ෂාව හා ළමා ශ්‍රමය මර්දනය සඳහා දරන උත්සාහයන් ඉදිරියට ගෙන යෑම (ටියුනීසියාව # 2);

6.163. ආබාධ සහිත පුද්ගලයින්ට අධ්‍යාපන, රැකියා, පොදු ප්‍රවාහනය, සෞඛ්‍ය සහ දේශපාලනික සහභාගිත්වය ආදී ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රවේශය වීම සහ වෙනස්කම් කරන නීති හා රෙගුලාසි ඉවත් කිරීම (මෙක්සිකෝව # 3);

6.164. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහය ලබා දෙන සුබසාධන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබාදීම (අසර්බයිජානය # 3);

6.165. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා වන උත්සාහයන් ඉදිරියට ගෙන යෑම (බෲනයි ධරුස්සලම් # 1);

6.166. ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන හා සෞඛ්‍ය ක්‍රමයේ දුර්වල ප්‍රවේශයන් වැනි ගැටළු ක්‍රමවත්ව විසඳීම ඉදිරියට ගෙන යාම (ජපානය # 2);

6.167 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් සම්පූර්ණයෙන් භුක්ති විඳීමට හැකි වන පරිදි දෙමළ ජනතාවගේ ආරක්ෂණ වැඩසටහන් සහ ප්‍රතිපත්ති දිගටම ගෙන යාම (පේරු 3);

6.168. ජනවාර්ගික, භාෂාමය සහ ආගමික විවිධත්වය පූර්ණ වශයෙන් ඒකාබද්ධ කළ හැකි බවට වගබලා ගැනීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සමාන ආර්ථික හා සමාජීය අවස්ථාවන් ලබා දීම සහ පුරුදු සහ ආයතන නිර්මාණය කිරීම සඳහා විශේෂ අවධානය යොමු කිරීම (ග්වාටමාලාව #6);

6.169. සංක්‍රමණික කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතියට අනුකූලව සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා රැකියා සංක්‍රමණික අධිකාරිය පනත ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම (ඉන්දුනීසියාව # 1);

6.170. අවිධිමත් සංක්‍රමණිකයන්, විශේෂයෙන්ම පවුල් සහ ළමුන් රඳවාගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග යෙදවීම (පෘතුගාලය #3)

6.171. රැකවරණ පතන්නන් සහ සරණාගතයින්ට ජාතික වශෙයන් ලබා ගත හැකි අධ්‍යාපන සේවාවන්ට ප්‍රවේශය සැපයීම සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම. (වතිකානුව # 4);

6.172. අභ්‍යන්තර අවතැන්වූවන් නැවත පැමිණීම සහ යළි පදිංචි කිරීම සහතික කිරීම සඳහා තවදුරටත් උත්සාහයන් දැරීම (අසර්බයිජානය # 2);

6.173. ගැටුම්වලින් විපතට පත් වූ හා අවතැන් වූ ජනතාවගේ අවශ්‍යතා සඳහා විසඳුම් සෙවීම හා ඔවුන්ගේ අවතැන්වීම්වලට ස්ථිර විසඳුම් වෙනුවෙන් පියවර ගැනීම (ඊජිප්තුව # 3);

6.174. ජීවිතයට ඇති අයිතිය සහ කිසිම ආකාරයක වෙනස්කම් නොකිරීමේ අයිතිය සහතික කරන, අයිතීන් පිළිබඳ නව පනතක් සලකා බැලීම ඇතුළුව, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දිගටම නියැලී සිටීම, (දකුණු අප්‍රිකාව # 1)

6.175. අතුරුදහන්වූවන්ගේ කාර්යාලයක්, සත්‍ය සොයන කොමිසමක් සහ වන්දි ගෙවීමේ කාර්යාලයක් සහ විශේෂ උපදේශකයකු සමඟ අධිකරණමය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම ඇතුළු පුළුල් සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයක් ඇති කිරීම. (දකුණු අප්‍රිකාව # 2)

6.176. මානව අයිතිවාසිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 යටතේ සිය වගකීම් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම. (ඕස්ට්‍රේලියාව # 1)

6.177. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් අවසන් කිරීමට පියවර ගැනීම සහ හිංසනය වැළැක්වීමේ පනතට සංශෝධන සැකසීම කඩිනම් කිරීම. (මාලදිවයින # 1)

<u>සටහන් කළ නිර්දේශ</u>

7.1. මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (මොන්ටිනේග්රෝ  #1), (ස්පාඤ්ඤය # 4);

7.2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (පෝලන්තය # 4);

7.3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම ඇතුළුව සියලු අවස්ථාවන්හිදී මරණ දණ්ඩනය භාවිතා කිරීම අත්හිටුවීම හා එය අහෝසි කිරීමට පියවර ගැනීම (නවසීලන්තය # 3)

7.4. 1951 සරණාගතයන් පිළිබඳ තත්වය හා 1967 ප්‍රොටොකෝලය පිළිබඳ ප්‍රඥප්තිය අපරානුමත කිරීම සලකා බැලීම. (අයිවොරි කෝස්ට් # 1)

7.5. වදහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළකීම්වලට ලක් කිරීමේ හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය සඳහා වන විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම මෙන්ම ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙහි රෝම ප්‍රඥප්තියට අනුබල දීම සහ ජාතික වධහිංසා වැළැක්වීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම (ඔස්ට්‍රියාව) # 1;

7.6. සන්නිවේදන ක්‍රියාපටිපාටියක් මත ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විකල්ප ප්‍රොටොකෝලය, ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අපරානුමත කිරීම (ස්ලොවැකියාව #4)

7.7. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ විකල්ප ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (බුරුන්ඩි # 2);

7.8. අවිආයුධ වෙළඳ ගිවිසුමට අනුකූලව හා න්‍යෂ්ටික අවි තහනම් කිරීම පිළිබඳ ගිවිසුම අත්සන් කිරීම අනුමත කිරීම හා ඒවා අනුවර්තනය කිරීම; (ග්වාටමාලාව # 4)

7.9. සරණාගතයින්ගේ තත්වය හා 1967 ප්‍රොටොකෝලය පිළිබඳව 1951 සම්මුතිය අපරානුමත කිරීම. (පෘතුගාලය # 4)

7.10. සරණාගතයින්ගේ තත්වය පිළිබඳ 1951 සම්මුතිය හා එහි 1967 ප්‍රොටොකෝලය අපරානුමත කිරීම (සියෙරා ලියෝන් # 1);

7.11. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය අපරානුමත කිරීම (ස්ලොවේනියාව # 2), (ටිමෝර්-ලෙස්ටේ # 1);

7.12. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය අපරානුමත කිරීම (එස්තෝනියාව # 3);

7.13. රෝම ප්‍රඥප්තිය සමග එහි ජාතික නීතිය අනුමත කිරීම හා අනුගත වීම (ග්වාටමාලාව # 3);

7.14. රෝම ප්‍රඥප්තිය යටතේ ඇති සියලුම වගකීම් සමග අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය තහවුරු කිරීම සහ එහි නීති සම්පූර්ණ කිරීම (ලැට්වියාව # 3);

7.15. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය හා ගෝත්‍රික ජනතාවගේ සම්මුතියේ නො. 169 අපරානුමත කිරීම; (ගුවාටමාලාව #2)

7.16. යුද අපරාධ සහ යුද අපරාධවලට සාපරාධී ආඥා පනත්වල නීතිමය සීමාවන් නොලැබීම පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීම (ආර්මේනියාව # 1);

7.17. නව ව්‍යවස්ථාව පැහැදිලිව හා පැහැදිලිවම බලය බෙදීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති සහතික කිරීම, චෙක්පත් සහ සමබරතාව තහවුරු කිරීම සහ අධිකරණයේ සහ අධිකරණයේ ස්වාධීනත්වය සහතික කිරීම, නව ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේදී සියලු පාර්ශවකරුවන්ට ස්ථානයක් හිමිවන බවට වගබලා ගැනීම සහතික කිරීම. (හයිටි # 1);

7.18. 2017-2021 දී සංවර්ධනය කරන ලද මනව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරි සැලස්ම ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා වගකිව යුතු අමාත්‍යාංශයක් පිහිටුවීම සලකා බැලීම (අයිවොරි කෝස්ට් # 2);

7.19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලදී වෙනස්කම් වලින් තොරව සමාන අයිතිවාසිකම් සහ සියළු පුද්ගලයන්ට සමානව සැලකිම තහවුරු කිරීම (කැනඩාව #1);

7.20. කාන්තාවන්ට වෙනස්කම් කිරීමට ඇති නීති වෙනස් කිරීම සහ සමලිංගික ලිංගික හැසිරීම් නිරපරාධකරණය කිරීම (ඕස්ට්‍රේලියාව # 2);

7.21. සමලිංගික හැසිරීම හා ස්නේහය පෙන්වීම සඳහා නඩු පැවරීම නිරපරාධකරණය කර, දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති අංක 365 සහ 365අ සංශෝධනය කිරීම (නෙදර්ලන්තය # 1);

7.22. සමලිංගික සබඳතා නිරපරාධකරණය කිරීම ප්‍රකාශයට පත් කිරීම හා LGBTI ප්‍රජාවට එරෙහිව සිදුවන වෙනස්කම් හා ප්‍රචණ්ඩත්වය මර්දනය සඳහා ශක්තිමත් පියවර ගැනීම (බ්‍රසීලය # 2);

7.23. දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 වගන්ති අවලංගු කිරීම මගින් සමාන ලිංගික හැසිරීම් නිරපරාධකරණය කිරීම (කැනඩාව # 4);

7.24. සමලිංගික හැසිරීම හා ස්නේහය පෙන්වීම සඳහා නඩු පැවරීම නිරපරාධකරණය කර, දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති අංක 365 සහ 365ඇ සංශෝධනය කිරීම (ස්වීඩනය # 2);

7.25. ලිංගික සංසර්ගයේ යෙදෙන අය අතර ලිංගික හැසිරීම් ලිහිල් කිරීම සඳහා පොලිස් අපරාධ නීති රීති වෙනස් කිරීම, පොලිස් අධිකාරීන් විසින් උල්ලංඝනය කිරීම හා හිරිහැර කිරීම් වැළැක්වීම සඳහා LGBTI ප්‍රජාවට එරෙහිව යොදා ගත හැකි පහත් කොන්දේසි මර්දනය කිරීම (උරුගුවේ # 3);

7.26. ලිංගික හැසිරීම් සහ ලිංගික අනන්‍යතාව මත පදනම් වූ වෙනස්කම් හා ප්‍රචණ්ඩත්වයට එරෙහිව කටයුතු කිරීම සඳහා අවශ්‍ය සියලූ පියවර අනුගමනය කිරීම සහ ළ්ස්ඕයෙ ජනතාව සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශ වීම සහතික කිරීම (හොන්ඩුරාස් # 3);

7.27. වෛරය පැතිරවීමට හා ප්‍රචණ්ඩත්වයට පොළොඹවන පුද්ගලයන්ට එරෙහිව දඬුවම් කිරීම සහ ඔවුන් ජාත්‍යන්තර නීතිය ඉදිරියට ගෙන යාම (ස්වීඩනය # 3);

7.28. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ එහි ප්‍රයෝජනය සඳහා ක්ෂනික තහනම පැනවීම; ත්‍රස්ත විමර්ශන පනත, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතින්වලට අනුකූල වන බවට වගබලා ගැනීම (කැනඩාව #2);

7.29. මරණ දඬුවම අහෝසි කිරීම (ඕස්ට්‍රේලියාව # 4);

7.30. මරණ දඬුවම අහෝසි කිරීම සඳහා නිශ්චිත පියවර ගැනීම (නෝර්වේ # 4);

7.31. මරණ දණ්ඩනය ලිඛිතව අහෝසි කිරීම (ප්‍රංශය අංක 6);

7.32. මරණීය දණ්ඩනය අහෝසි කිරීම, සියලු අපේක්ෂා භංගත්වයන් සඳහා වන බලාධිකාරයයන් සඳහා මරණ දඬුවම් නියම කිරීම සහ සිර දඬුවම්වලට සිය මරණ දඬුවම් මාරු කිරීම (ස්ලොවේකියාව # 2);

7.33. මරණීය දණ්ඩනය අහෝසි කිරීම සහ මරණ දඬුවම්, සිර දඬුවම්වලට මාරු කිරීම (වතිකානුව #1);

7.34. 1975 සිට අධිකරණ ඝාතන සම්බන්ධයෙන් තහනම සලකා බලා මරණ දඬුවම අහෝසි කිරීම (නැමීබියාව #1);

7.35. ආරම්භයේ සිටම සියලු රැඳවියන්ට මූලික නීතිමය ආරක්ෂාවන් ලබා දී ඇති බවට නීතියෙන් හා ප්‍රායෝගිකව තහවුරු කර ගැනීම (වතිකානුව #2);

7.36. අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ ඒකාබද්ධ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීම (ස්විස්ටර්ලන්තය # 2);

7.37. අභ්‍යන්තර ගැටුම් සමයේදී සිදුවූවා යැයි කියන යුධ අපරාධ සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පරීක්ෂණයට සහ නඩු පවරන බවට වගබලා ගැනීම සඳහා පුළුල් ක්‍රියාමාර්ග ගැනීම. (එස්ටෝනියාව # 1);

7.38. බරපතළ මානව හිමිකම් උල්ලංඝණ චෝදනා පිළිබඳ සත්‍ය විමර්ශනය කිරීම සඳහා සත්‍ය තොරතුරු කොමිසමක් සහ වන්දි ගෙවීමේ කාර්යාලයක් මෙන්ම විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීම සඳහා පවතින ක්‍රියාදාමය වේගවත් කිරීම සහ පැහැදිලි කාල රාමුවක් ස්ථාපිත කිරීම. (කොරියානු ජනරජය අංක 2)

7.39. ජාතික අයවැය තුළ කැප වූ මූල්‍ය සම්පත් සහ පත් කර ඇති විශේෂඥයන් හරහා සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාදාම යාන්ත්‍රණ හතර ශක්තිමත් කිරීම (පූර්ව යුගොස්ලාවියානු සමූහාණ්ඩුව මැසඩෝනියාව #2);

7.40. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 පනත යටතේ ශ්‍රී ලංකාවේ කැපවීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි කාල රාමුවක් සහ මිනුම් දඬු සකස් කිරීම. (ජර්මනිය # 4)

7.41. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 හි කැපවීම් පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි කාල රාමුවක් සහ මිණුම් දඬු සකස් කිරීම. (නොර්වේ # 3)

7.42. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 යටතේ යටතේ එහි පූර්ණ වගකීම් ඉටුකිරීමේ නිරීක්ෂණ රාමුව සමග නිරවද්‍ය කාල රාමුවක් සකස් කිරීම. (පූර්ව යුගොස්ලාවියානු සමූහාණ්ඩුව මැසඩෝනියාව # 1)

7.43. අන්තර්ජාතික සන්ක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණය ස්ථාපිත කිරීම ඇතුළු මානව හිමිකම් කවුන්සිලයේ 30/1 හි කැපවීම මත කටයුතු කිරීම සහ මෙම අරමුණ සඳහා පැහැදිලි කාල රාමුවක් ස්ථාපිත කිරීම (ඔස්ට්‍රියාව #3);

7.44. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි කාල රාමුවක් සහ මිනුම් දඬු සකස් කිරීම (ඩෙන්මාර්කය # 1);

7.45. මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව 30/1 කඩිනම් ව ක්‍රියාවට නැංවීම මගින්, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය දියත් කිරීම, සිවිල් ක්‍රියකාරකම් සඳහා හමුදා මැදිහත් වීම අවසන් කිරීම, සිවිල් අයිතිකරුවන්ට ඉඩම් ආපසු ලබා දීම, විදේශීය විමර්ශකයන්, නීතිඥයින් සහ විනිශ්චයකරුවන්ගෙන් යුක්ත නීතිමය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම ඇතුළුව සංහිඳියාව වර්ධනය කිරීමට කැපවීම (කැනඩාව # 3);

7.46. බියවැද්දීම් හා ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා මාධ්‍යවේදීන් හා මානව හිමිකම් ආරක්ෂකයන් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ එවැනි ක්‍රියා පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සහ අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම සහතික කිරීම (ඔස්ට්‍රියාව #2);

7.47. රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල සිවිල් භාවිතය සඳහා ඉඩම් ලබාදීම සිදු කිරීම (ඝානාව අංක 3);

7.48. අන්තර්ජාතික නීති ප්‍රමිතීන් මගින් අපේක්ෂා කරන පරිදි දිගුකාලීන වශයෙන් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් සහ සරණාගතයින්ට නීතිමය අයිතිය සහ නැවත ගෙවීම සහතික කිරීමට අඛණ්ඩව කටයුතු කිරීම (වතිකානුව # 5);

7.49. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීම සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීමේ විධිවිධාන ඉවත් කිරීම සහ දේශපාලන ක්‍රියාවලියේ නිරත වීමට බාධා කිරීම සඳහා සියලු පෞද්ගලික නීති සංශෝධනය කිරීම (කැනඩාව # 5);

7.50. විවාහ ලිංගික දූෂණය අපරාධකරණය කිරීම මගින් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම සඳහා පියවර ගැනීම ශක්තිමත් කිරීම (බෙල්ජියම # 3);

7.51. විවාහ ලිංගික දූෂණය ඇතුළුව ගෘහස්ථ හිංසනය පැහැදිලිවම තහනම් කරන ලද විශේෂ නීතිරීති අනුගමනය කිරීම සහ ඒවා දැඩිව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සහතික කිරීම (ස්ලොවේනියාව # 3);

7.52. ස්ත්‍රී දූෂණය, ව්‍යභිචාරය හා දරු වන භ්‍රෑණීය තත්ත්වයන් වලදී ගැබ් ගැනීම් අවසන් කිරීම සම්බන්ධ සියලු දණ්ඩනීය පියවර ඉවත් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම (ඩෙන්මාර්කය # 2);

7.53. සරණාගත තත්ත්වය නිර්ණය කිරීම සඳහා ජාතික ක්‍රම පටිපාටියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම (ආර්ජන්ටිනාව # 3);